ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media
No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2025.06.04

| 06 | 04 |
|---|---|

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,
පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**ඩෙංගු සහ වසංගත රෝග සම්බන්ධව මාධ්‍ය වෙත නිල ප්‍රකාශ නිකුත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිලධාරින් දෙදෙනෙක් නම් කෙරේ.**

ඩෙංගු සහ වසංගත රෝග සම්බන්ධව මාධ්‍ය වෙත කරුණු පැහැදිළි කිරීම සහ නිල ප්‍රකාශ නිකුත් කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත් කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පියවර ගෙන ඇත.

ඩෙංගු සහ වසංගත රෝග තත්ත්වයන් පිළිබඳව සාවද්‍ය තොරතුරු සමාජගතවීම තුළ සමාජයේ අනිසි බියක් ඇතිවීම වැළැක්වීමත්, නිල නොවන අයුරින් සිදු කරන ප්‍රකාශයන් හේතුවෙන් මාධ්‍ය තුළින් වැරදි අර්ථකථනයක් ඉදිරිපත් වීම වැළැක්විමත් යන කරුණු සැලකිල්ලට ගෙන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම පත්කිරීම් සිදු කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව ඩෙංගු රෝගය පිළිබඳව ජාතික ඩෙංගු මර්දන ඒකකයේ ප්‍රජා විශේෂඥ වෛද්‍ය ප්‍රසීලා සමරවීර මහත්මියත්, වසංගත රෝග තත්ත්වයන් සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ වසංගත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ මහතාත් මින් ඉදිරියට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් ඩෙංගු සහ වසංගත රෝග සම්බන්ධව මාධ්‍ය වෙත නිවැරදි හා නිල ප්‍රකාශ නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

එමෙන් ම ඉහත කරුණු වලට අදාළ තොරතුරු ලබාගැනීමේ දී නම් කර ඇති නිලධාරීන් වෙතින් පමණක් තොතුරු ලබාගන්නා ලෙස සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන්ගෙන් ද කාරුණික ඉල්ලීමක් කර සිටී.

අදාළ නිලධාරීන් සම්බන්ධීකරණය කරගත හැකි දුරකථන අංක සහ විද්‍යුත් ලිපින පහතින් දැක් වේ.

01. ජාතික ඩෙංගු මර්දන ඒකකයේ ප්‍රජා විශේෂඥ වෛද්‍ය ප්‍රසීලා සමරවීර මහත්මිය.
071 4938916
විද්‍යුත් ලිපිනය - preshilas@gmail.com

02. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ වසංගත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ මහතා.
071 5999757
විද්‍යුත් ලිපිනය - epidunit@sltnet.lk

දීප්ති විජේතුංග
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය මාධ්‍ය ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.